# ගෙවත්තෙන් පල ලබමු

## ඔබට උචිත එළවලු වගාවන්

> ප්‍රායෝගික කෘෂිකාර්මික උපදෙස් දෙන ලිපි පෙළක් පළ කරන ලෙස අප පාඨකයින්ගෙන් ඉල්ලීම් රාශියක් ලැබී ඇත්තෙමි. එම ඉල්ලීම් ඉටු කරමින් අපි අද එළවලු වගාව පිළිබඳව මේ ලිපිය පළකරමු. එය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති අංශයේ කාරුණික අනුග්‍රහයෙනි.

එළවළු බීජ කෙලින්ම ගෙවත්තේ සිටුවිය හැක. එසේ නැත්නම් පළමුව තවානක සිටුවා පසුව ගලවා ඉඩමේ සිටවනු ලැබේ. කෙලින්ම සිටුවන බීජ නියමිත පරතරයක් ඇතිව වලවල් වල සිටවනු ලැබේ. නැත්නම් නොගැඹුරු කාණුවල සිටවනු ලැබේ. ලොකු බීජ සහිත වර්ග (උදහරණ:- බෝංචි, මෑ සහ පතෝල, වැටකොළු යනාදිය නියමිත පරතරයක් ඇතිව කුඩා වල වල්වල සිටුවනු ලැබේ. කුඩා බීජ සහිත වර්ග (උදහරණ:- කැරට්, තම්පලා. යනාදිය) නොගැඹුරු කාණුවල කෙලින්ම සිටුවා පසුව වැඩිපුර පැල ගලවා අවශ්‍ය පරතරය තිබෙන විදියට තුනී කළ යුතුය. ඉතා කුඩා ඇට සහිත වර්ග (උදහරණ:- මිරිස්, තක්කාලි සහ බටු යනාදිය) පළමුව තවානක දමා පසුව ඉඩමේ සිටවනු ලැබේ.


**තවාන:-**

පරණ ලී පෙට්ටි තවාන් දැමීමට පාවිච්චි කළ හැක. වතුර බැස යාමට අඩියේ සිදුරු සෑදිය යුතුය. එයට යොදන පස් මිශ්‍රණය පහත සඳහන් පරිදි සාදගත යුතුය. සල්ලඩයකින් හලාගත් ලෝම් පස් (උදා:= මතුපිට පස්) කොටස් 2, දිරූ කොළ හෝ කුඩුකර ගත් ගොම පොහොර කොටස් 1 සහ වැලි කොටස් 1 යි.

මෙම පස් මිශ්‍රණය පෙට්ටියට දැමීමට ප්‍රථමයෙන් එහි අඩියට ගඩොල් කැබලි හෝ උළු කැබලි දමා ඒවා දිරාපත් කොල තට්ටුවකින් වසන්න. ඒ මලින් හොඳින් වතුර බැසයාමට ඉඩ සැලසේ පෙට්ටියේ පස් මට්ටම් කරගෙන ඒ මත බීජ සිටුවා තුනී පස් තට්ටුවකින් යටකර පස තදකළ යුතුය. පසුව තෙත් ගතියකින් යුක්තව එය තබාගත යුතුය.

පුළුල් වශයෙන් වගා කිරීම සඳහා සෙවන සහිත ස්ථානයක තවාන් පිළියෙල කර පැල පස මතුපිටට පැලවෙන තුරු වසා තැබිය යුතුය. එයට පසු වැස්ම ඉවත්කර ක්ෂේත්‍ර තත්ත්වයන්ට පැල හැඩගැස්සීමට ඉඩදිය යුතුය.

බීජ පැල සාමාන්‍යයෙන් සිටුවනු ලබන්නේ සති 4–6 ක් වයස්වූ විට හෝ අඟල් 6–8 ක් උස්වූ විටය. තවාන් අවසථාවේදී පාත්ති දිනපතා වතුර දමා පේලි අතර පස් උල්වූ කෝටුවකින් බුරුල්කර තැබීම අවශ්‍යය. ඉඩමේ සිටුවීමට ගතයුත්තේ ශක්තිමත් සහ නිරෝගී පැල පමණය. තක්කාලි, මිරිස් සහ බටු යනාදිය සිටුවීමට ප්‍රථම අගිස් කඩාදමනු ලැබේ. මේ නිසා හොඳින් අතුදැමීම සිදුවේ.



වියලි කාලගුණයක් පවතිනම් පැල ගලවා ගැනීමට පැය කීපයකට ප්‍රථම තවාන් පාත්තිවලට හෝ පෙට්ටිවලට ජලය සැපයීමෙන් ඒවා පහසුවෙන් ගලවාගත හැකි වේ.

පැල සිටුවීම සවස් කාලයේ කිරීම වඩාත් සුදුසුය. එවිට රාත්‍රී කාලයේ ලැබෙන සිසිල් තත්ත්වය මගින් මුල් අල්ලා ගැනීමට ඉඩ ලැබේ. පැල සිටුවා වටේට පස හොඳින් තදකර හොඳින් ජලය සපයන්න. දිවා කාලය සාමාන්‍ය තත්ත්වයට වඩා උෂ්ණ නම් පැල හොඳින් වැඩෙන තුරු සෙවන සැපයීම අවශ්‍යවේ.

**බිම් සකස් කිරීම:**

වලවල් හෝ කළුවැටිවල සිටුවන වර්ග හැර අනෙක් එළවළු සිටුවිය යුත්තේ අඩියක් පළල කාණුවලින් වෙන්වූ අඟල් 6–9 ක් උස, උස්වූ පාත්තිවලය, මේ මගින් ජලය රඳා පැවැත්වීම වලකී. බෝගයට පහසුවෙන් සාත්තු කිරීම සඳහා පාත්ති අඩි 3–4 කට වඩා පළල් නොවිය යුතුය.

# එළවළු වගා විස්තර

| එළවළු | නිර්දේශිත වර්ග | අක්කරයට බීජ ප්‍රමාණය | තවාන | සිටුවන පරතරය |
| --- | --- | --- | --- | --- |
| බණ්ඩක්කා | ඇම්. අයි. –5<br>ඇම්. අයි. 7 සහ වී. ටී. | රා. 3 – 4 | — | 3′ x 3′ |
| වැල් බෝංචි | කෙන්ටකි වන්ඩර්<br>ලංකා නිල් | රා. 40 – 50 | — | 3′ x 9″ |
| පඳුරු බෝංචි | ටොප්, ක්‍රොප්<br>වේඩ්, වෙරෝකිවැක්ස් | රා. 60  80 | — | 2½′ x 4″ |
| බීට් | ක්‍රිම්සන් ග්ලෝබ්,<br>ටොප් මාර්කට්<br>ඩාක් රෙඩ්<br>ක්වීන්ස් ග්ලෝබ් | රා 5 | — | 12″ x 4″ |
| වම්බටු | දෙපාර්තමේන්තු තේරීම | අවු. 4 | සති 4—6 දී පැළ ගලවා සිටුවන්න | 3′ x 3′ |
| ගෝවා | හර්කියුලිස්,<br>ඇට්ලස්, කේ. වයි.<br>ලියෝ, ඒ. ඇස්, තාකයි,<br>නොසාකි. | අවු. 6 | සති 4—6 දී පැළ ගලවා සිටුවන්න | 2′ x 2½′ |
| මාළු මිරිස් | හන්ගේරියන් යෙලෝ,<br>දෙපාර්තමේන්තු තේරීම | අවු. 6–4 | සති 4—6 දී පැළ ගලවා සිටුවන්න | 2′ x 2′ |
| කැරට් | ටොප්වේට්, කේප්මාර්කට්<br>කැන්ටිස් | රා. 4 | — | 8″ x 8″ |
| මෑ | හවරි මෑ, මුරුංගා මෑ,<br>පොලොන් මෑ | රා. 20 | — | 3′ x 1′ |
| මල් ගෝවා | අර්ලි පිනෝමිනල්,<br>අර්ලි පැට්නා, | අවු. 6 | සති 4—6 දී පැළ ගලවා සිටුවන්න | 1½′ x 1½′ |
| පිපිඤ්ඤා | දෙපාර්තමේන්තු තේරීම | රා. 2 | | 2′ x 2′ |
| පතෝල | දෙපාර්තමේන්තු තේරීම | රා. 5 | — | 5′ x 4′ |

# උපලේඛණය

| අස්වනු නෙලීම | අක්කරයට අස්වැන්න | පලිබෝධකයෝ | වෙනත් විස්තර |
|---|---|---|---|
| මාස 1½—2 | රු. 6000 | කොළ කන සහ කරල් විදින දළඹුවෝ | — |
| දින 60—65 | රු. 4000 | බෝංචි මැස්සා | අඩි 5 ක් උස කණු සැපයිය යුතුයි. |
| දින 45—50 | රු. 3000 | බෝංචි මැස්සා | — |
| මාස 2½—3 | රු. 18000 | කියත් පණුවා | — |
| මාස 3 | රු. 15000 | කොළ කන සහ ගෙඩි විදින පණුවා | — |
| වර්ගය අනුව මාස 3—4 | රු. 25000 | කියත් පණුවා, දළඹුවෝ බග්රාඩා මකුණා | — |
| මාස 3 | රු 3500 | — | — |
| මාස 3 | රු. 15000 | කියත් පණුවා | — |
| මාස 2 | රු. 2500 | කරල් විදින දළඹුවෝ | අඩි 4—5 ක් උස ආධාර කණු සැපයිය යුතුයි. |
| සති 9—12 | — | කියත් පණුවෝ, දළඹුවෝ | ගෙඩි සුදු පාටින් තිබීමට කොළ වලින් වසන්න. |
| මාස 2 | රු. 15000 | පලතුරු මැස්සා | — |
| මාස 2 | රු 15000 | පලතුරු මැස්සා අවුලකපෝරා කුරුමිණියා | අඩි 6—7 ක් උස මැස්සකට වැල් යවන්න. |

| එළවළු | නිර්දේශිත වර්ග | අක්කරයට බීජ ප්‍රමාණය | තවාන | සිටුවන පරතරය |
|---|---|---|---|---|
| වැටකොළු | දෙපාර්තමේන්තු තේරීම | රා. 3 | — | 4′ x 4′ |
| කරවිල | දෙපාර්තමේන්තු තේරීම | රා. 5 | — | 4′ x 3′ |
| නෝකෝල් | අර්ලි වයිට් වියානා | අවු. 8 | — | 4′′ x 6′′ |
| සලාද | ග්‍රෑන්ඩ් රැපිඩ්ස්, ග්‍රේට් ලේක්ස් | අවු. 6 | දෙවැනි කොළය ඇත්වෙන විට ගලවා සිටුවන්න | 1′ x 1′ |
| ලීක්ස් | ලාජ් ලෝන් සමර් | අවු. 4 | සති 4–6 දී ගලවා සිටුවන්න | 8′′ x 6′′ |
| වට්ටක්කා | දෙපාර්තමේන්තු තේරීම | රා.1–1 1/2 | — | 6′ x 6′ |
| රාබු | ජපන් බෝල, බීරළු | රා. 4 | — | 12′′ x 6′′ |
| තක්කාලි | මාග්ලෝබ්, රෝමා, හිටුමැරීමට ඔරොත්තු දෙන වර්ගය | අවු. 4 | සති 4–6 දී ගලවා සිටුවන්න | 2′ x 1′ |
| මුරුංගා | — | අඩි 5 ක් දිග අඟල් 1½ ක් විෂ්කම්භය ඇති දඬුකෑබලි | — | 8′ — 10′ |
| කතුරු මුරුංගා | — | බීජ | — | 8′ |
| නිවිති | දෙපාර්තමේන්තු තේරීම | බීජ | — | 1½′ — 1′ |
| තම්පලා | දෙපාර්තමේන්තු තේරීම | බීජ | — | 6′′ x 6′′ |

සටහන: ගෙවතු වගාවන් සඳහා කුඩා

| අස්වනු නෙලීම | අක්කරයට අස්වැන්න | පලිබෝධකයෝ | වෙනත් විස්තර |
|---|---|---|---|
| මාස 2½—3 | රු. 15000 | පලතුරු මැස්සා, අවුලකපෝරා කුරුමිණියා | පත්දලමකට වැල් යවන්න |
| මාස 2½—3 | රු. 15000 | පලතුරු මැස්සා, අවුලකපෝරා කුරුමිණියා | පත්දලමකට වැල් යවන්න |
| මාස 3—4 | රු. 6000 | — | — |
| සති 3 | රු. 2000 | කියත් පණුවෝ, දළඹුවෝ | — |
| මාස 6—6 | රු. 20000 | කියත් පණුවෝ, දළඹුවෝ | කඳ සුදු පාටින් තිබීමට වටේට පස් එකතු කරන්න |
| මාස 4 | රු. 20000 | — | — |
| සති 6—7 | රු. 10300 | — | — |
| මාස 2½—3 | රු. 10000 | — | මාග්ලෝබ් සහ රෝමා සඳහා කණු සිටුවන්න (අඩි4–5 උස) |
| මාස 12 (කරල්) | — | දළඹුවෝ | — |
| මාස 12 (කොළ සහ මල්) | — | දළඹුවෝ | — |
| මාස 3 | රු. 15000 | — | අඩි 2 ක් උස මැස්සකට වැල් යවන්න |
| සති 3—4 | — | — | — |

ප්‍රමාණයේ බීජ පැකට් ලබාගත හැක.